## 48

# යුග පුරුෂයාණෙනි!

*මඩකුඹුරුමුල්ලේ සෝම එච්. පතිරණ*

මහ ඇදුරි'ඳුව කැලණිය සරසවිය  දිනූ
මොළ සිය-දහස් රට-ජාතිය පිණිස  තැනූ
ගුරුදෙවි - කුමරසිංහයො - කුලතිලක  යනූ
යුග-පුරුෂයෙකි, ගුරු කුලයක පහළ  වුණූ

සිය සරසවිය වෙත විත් පෙළ ගැහෙන  වටේ
කුල දූදරුවො ජාතියෙ සම්පතය  රටේ
හැඟුමෙන් ඇදුරෙකුගෙ බස් පිටකෙරුව  කටේ
සිහිවෙන විටත් දෙනෙතින් තුටු කඳුලු  වැටේ

අත කොළුවනු එපා! කියමින් "මගෙද  ඔබ"
නව ලොව අසිරිමත් විදුහුරු දැනුම  ලැබ
පෙළ ගැස්වෙන්න නිවහල් යුගයකට  සුබ
මඟ හෙළිකළෝ මේ සරසවි දෙරණ  ගැබ

පෙන්වා ගමන් මඟ ආ සරසවිය  කරා
යන්නට නැවත ගතයුතු දේ සුරත  පුරා
පැහැදිලි කළ හෙයින් ඔබ හිඳ අසුන  අරා
මරුවෝ හැපුණි දරුවන් ගනු බැරිව  මරා

නොබැඳී පිල්වලට සිසු පෙරමුණෙ ම  සිට
යුගයෙන් - යුගය ආ දරුවන් එකතු  කොට
පරපුර නොගෙන පැමිණියෙ නම් ජනිත  රට
මතුවෙද මෙවැනි සමයක මිණි-පළිඟු  කැට

පිළිසිඳ කැලණි සරසවි මව්-තුමිය  කුසේ
ගත්මඟ මෙඔබ- පිවිතුරු සිතුවමය  ඇසේ
බරගෙන දිසාපාමොක්වරයෙකුගෙ  හිසේ
පිබිදුව කුසුම්වල මල්-ඵල බරය  මෙසේ



කෙටි සහ නවකතා සාහිත ඉති  හාසේ
පෙන්වා රැඳෙන මානවගුණ මඳ -  හාසේ
නොකැඩුවෙහි නම් කොරපොතු අඳබල  දැසේ
නොපිපෙයි යුගයකට රන්මල් දිනු  දේසේ

සරසවියට වැදුණු දෙස්පාලන  බූව
වටිනා දැයක සම්පත ඩැහැගෙන  කැව
යුගයක ඔබට අත්විඳ ගැනුමට  ආව
පෙරමෙන් දූ-පුතුන් බිහිවෙනවද  දාව